**සැලසිනේ රූපවාහිනී ආයතනය - 2021**

**-------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

සැලසිනේ රූපවාහිනී ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය**

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනය විසින් ගිණුම්කරණ මෘදුකාංග පද්ධතිය අවශ්‍යතාවයට ගැලපෙන පරිදි සකසා ගෙන නොතිබුණි. | 2022 වර්ෂයේ සිට ඔබගේ අවශ්‍යතාවය අනුව කටයුතු කිරීමට අවභ්‍ය කටයුතු යොදා ඇත. | නිවැරදි තොරතුරු ලබාගත හැකිවන පරිදි ගිණුම්කරණ මෘදුකාංග පද්ධතිය සකසා ගැනීමට කටයුතු කලයුතුය. |

**1.5.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 හි 51 වන වගන්තිය අනුව සියළුම දේපල පිරියත හා උපකරණ වල ඵලදායී ජීවිත කාලය සමාලෝචනය අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදී ම කල යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණු අතර පිරිවැය රු.19,321,400 ක් වූ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද දේපල පිරියත හා උපකරණ දැනට භාවිතයේ පැවතුණි. එම ප්‍රමිතියෙහිම 79හි(b) වගන්තිය අනුව දැනට භාවිතයේ පවතින සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද දේපල පිරියත හා | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16හි 51 වන වගන්තියට අනුව සියලුම දේපල පිරියත හා උපකරණවල ඵලදායී පිවිතකාලය සමාලෝචනය කිරීම සඳහා කටයුතු කිරීමේ පළමු පියවර ලෙස සියලූම වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලැබී ඇති බැවින්, ඒ අනුව කටයුතු කිරීමට අදාල නිලධාරීන් දැනුවත් කොට ඇති අතර, එම ප්‍රමිතයෙහිම 79 හි (b) වගන්තිය ප්‍රකාරව ඉදිරියේ දී කටයුතු කරමි. | ප්‍රමිතියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | |
|---|---|
| | උපකරණ වල දල ධාරණ අගය මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කල යුතු වුවත් එම වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ දී ලද එකතු වටිනාකම රු.755,271 ක ණයගැති ශේෂ 10 ක් මූල්‍ය ප්‍රකාශනවල වෙළඳ ණයගැතියන්ගෙන් අඩු කොට දක්වා තිබුණි. | ණයගැති ලැබීමත් වන රු.755,271 ක ශේෂය කුමන ණයගැතියන්ගේ කුමන කාර්ය සඳහා ලැබී ඇති දැයි මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී ද හෙළිදරව් කර ගැනීමට නොහැකි වූ බැවින්, එය මූල්‍ය ප්‍රකාශනවල වෙළඳ ණයගැති ශේෂයෙන් අඩුකොට දක්වා ඇත. මේ පිළිබඳව විමර්ෂණය කරන අතර 2023 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ණයගැති ලැබීම් හඳුනාගෙන නිරවුල් කල යුතුය. |
| (ආ) ආයතනය රටවැසි යුතුකම නමින් සමාජ සේවා කටයුතු සඳහා වර්ෂය තුළ රු.10,668,520 ක් වැය කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයට උපචිත වියදම රු.4,850,000 ක් වී තිබුණි.එම වටිනාකම ගිණුම් වලට ඇතුලත් කර නොතිබීම හේතුවෙන් ජංගම වගකීම් සහ වර්ෂයේ අලාභය රු.4,850,000 කින් අඩුවෙන් දක්වා තිබුණි. | රු.10,668,520 ක් මුදලක් ආයතනය විසින් රටවැසි යුතුකම නම් සමාජ සේවා කටයුතු සඳහා වර්ෂය තුල වැය කර තිබුණි. තව දුරටත් ඒ සඳහා කිසිදු මුදලක් ගෙවීමට මෙම පාලනාධිකාරිය තීරණය නොකරන බැවින් කිසිදු මුදලක් ඒ සඳහා ගෙවීමටත්, වෙන් නොකිරීමටත් තීරණය කර ඇත. | වැයකරන ලද වටිනාකම් නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුය. |

### 1.5.4 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ)ඉතිරි කිරීමේ ගිණුම් ශේෂය | 26,817,817 | 27,483,194 | 665,377 | එය බැංකු සැසඳුම සකස් කිරීමේ දී සොයා ගන්නා ලද කරුණක් වූ අතර, ඒ වන විට ද මුදල් පොත තුලනය කර තිබූ | වටිනාකම් නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | බැවින්, ඊට අදාල නිවැරදි කිරීම 2022 අප්‍රේල් මස මුදල් පොතෙන් ගලපා නිවැරදි ශේෂය පෙන්නුම් කොට ඇත. අදාල සටහනක් ද යොදා ඇත. | |
| (ආ) ගෙවියයුතු එකතුකළ අගය මත බදු | 32,300,288 | 28,884,905 | 3,415,333 | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මගින් මා ලබා ගන්නාලද තොරතුරු අනුව අප විසින් ගිණුම් පොත්වල රැගෙන එන ශේෂයන් හි නොගැලපීමක් නිරීක්ෂණය වේ. එය නිවැරදි කිරීමට අදාල තීන්දු තීරණ ගනිමින් පවතින බවත්, එම සත්‍ය වගකීම ගිණුම්වල පෙන්වීමට කටයුතු කරන බව ද දන්වා සිටිමි. | වටිනාකම් නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුය. |

### 1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| බැංකු ශේෂය | - | බැංකු ශේෂ සනාථ කිරීමේ ලිපි | බැංකු ශේෂ සනාථන කැඳවීමේ දී මින් ඉදිරියට සෘජුවම රජයේ විගණන අංශය වෙත ලැබීමට කටයුතු කරමි. | ශේෂ සනාථන සෘජුවම රජයේ විගණන අංශය වෙත ලැබෙන සේ කැඳවිය යුතුය. |

### 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වර්ෂ 06 ක සිට පැවත එන අය නොවී පැවති ගිණුම් ශේෂ 04ක වටිනාකම වූ රු.2,739,878 ක් අයකර ගැනීමට හා ගෙවිය යුතුව පැවති ගිණුම් ශේෂ 03ක වටිනාකම වූ රු.218,396 ක් ගෙවා නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය තුල දීද කටයුතු කර නොතිබුණි. | වර්ෂ කිහිපයක සිට පැවත එන ජංගම වත්කම් හා වගකීම් ශේෂයන් කිහිපයක් 2021 වර්ෂයේ අවසන් ගිණුම් සකස් කිරීමේ දී අප හට ද නිරීක්ෂණය විය. 2022 න් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී මෙය නිවැරදි කොට ඇත. | අයකර ගතයුතු හා ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට අප්‍රමාදව කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) ආයතනයේ මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන වෙළඳ හා ලැබියයුතු ශේෂ සහ වෙළඳ හා ගෙවියයුතු ශේෂ වලට අදාළ ණයගැති හා ණයහිමි ආයතන වල මූල්‍ය ප්‍රකාශනයන්හි ශේෂ සමඟ සැසදීමේදී, ආයතන 03කින් ලැබියයුතු ශේෂය රු.4,465,542 ක් ද ආයතනයකින් ලැබියයුතු ශේෂය රු.326,518 ක් ද ආයතන 03 කට ගෙවියයුතු ශේෂ රු.7,866,360 ක් ද වෙනස් අගයන්ගෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වෙළඳ ලැබිය යුතු ශේෂ සහ වෙළඳ ගෙවිය යුතු ශේෂයන් ගේ නිවැරදිතාවය කඩිනමින් පරීක්ෂා කිරීමට දැනටමත් අප විසින් එම ආයතන වෙතින් සැසඳුම් ප්‍රකාශ ඉල්ලා ඇති අතර, එම සැසඳුම් ප්‍රකාශ ලද වහාම සත්‍ය ණයහිමි භාවය මත පදනම්ව අවශ්‍ය කටයුතු කිරීමට අදාලව නිලධාරීන්ට උපදෙස් ලබා දුනි. | ලැබියයුතු ශේෂ සහ ගෙවියයුතු ශේෂ නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුය. |
| (ඇ)සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සේවාදායක ණයගැති ශේෂය රු.347,262,234 ක් වූ අතර ඉන් වසර 4 ඉක්මවා ඇති ශේෂය රු. 190,011,004 ක් හෙවත් මුළු ණයගැති ශේෂයෙන් සියයට 55 ක් වි තිබුණි.එසේම වසරට වඩා වැඩි ණයගැති ශේෂ අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග කිසිවක් ආයතනය ආරම්භයේ සිටම ගෙන නොතිබු බැවින් 2006 සිට පවතින රු.6,611,743 ක ණය ගැති ශේෂය කාලවරෝධ පනත යටතේ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට ඇති හැකියාව අවදානමට ලක් වී තිබුණි. | 2022-07-12 වන දින සිට ණය අයකර ගැනීමේ කටයුතු කඩිනමින් කිරීමට හා එය නිසි කළමනාකරණයකින් ඉටු කිරීමට ණය අයකර ගැනීමේ කමිටුවක් පත් කරන ලදි. කල් ඉකුත් වූ ණයගැතියන් සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය වැඩපිළිවෙල දැනටමත් සකස් කර ඇත. 2006 වසරේ සිට පැවැත එන රු. 6,611,743/- ක ණයගැති ශේෂය සම්බන්ධයෙන් වැඩිදුර පරීක්ෂා කරන ලදි. එම ශේෂය පොත් වලින් කපා හැරීමට නිර්දේශකර භාණ්ඩාගාරය වෙත දැනුම් දී ඇතත් මේ වන තෙක් ඒ සම්බන්ධව පසුවිමරමක් සිදු කර නොමැති අතර, ඒ සම්බන්ධ කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමට අදාල නිලධාරීන්ට උපදෙස් දී ඇත. | ණයගැති ශේෂ අයකර ගැනීම සඳහා අප්‍රමාදව කටයුතු කල යුතුය. |
| (ඇ) සමාලෝචිත වර්ෂය අවසන දිනට රු.347,262,234 ක් වූ මුළුවෙළඳ ණයගැතියන්ගෙන් සියයට 70 ක් හෙවත් රු.243,917,857 ක් මාස 03 ඉක්ම වූ ණය ගැතියන්ගෙන් සමන්විත වූ අතර ණයගැති ශේෂ තහවුරු කිරීම සඳහා ශේෂ සනාථන ලැබී නොතිබුණි. | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට වූ රු. 347,262,234/- ක් වූ වෙළෙඳ ණයගැති ශේෂයන් සඳහා ශේෂ තහවුරු කිරීමේ සනාථන ලිපි යවා ඇති අතර, ඉන් කිහිපයක් සඳහා පමණක් පිළිතුරු ලැබී ඇත. | ශේෂ සනාථන සෘජුවම රජයේ විගණන අංශය වෙත ලැබෙන සේ කැඳවිය යුතුය. |
| (ඉ) ආයතනය විසින් ජාතික චිත්‍රපට සංස්ථාවට අයත් අංක 224, බෞද්ධාලෝක මාවත, කොළඹ 07 දරණ ස්ථානයේ පිහිටි ගොඩනැගිල්ලේ පහළ මාලය අංක 4660 දරණ බදු ගිවිසුම මඟින් 2014 ජනවාරි 15 දින සිට | 2019 ජනවාරි 14 දිනෙන් පසුව විධිමත් පරිදි ජාතික චිත්‍රපට සංස්ථාව සමග ගිවිසුම් ගත නොවී තිබුණි. පෙර ගිවිසුම් ගත කාලසීමාවට අදාල කුලී මුදල් හා මාසික ජල විදුලිය සඳහා ද බිල්පත් පියවමින් පරිශ්‍රයේ රැඳී සිට ඇත. එමෙන්ම, 2014 ජනවාරි 15 වන | ගිවිසුම් ගත කාලය හා ගිවිසුම් ගත වියදම් පිළිබඳ අවධානය යොමුකරමින් ආයතන අතර |

| | | | |
|---|---|---|---|
| | 2019 ජනවාරි 14 දින දක්වා වසර 05ක කාලයකට බදු පදනම යටතේ ලබාගෙන තිබුණි.එසේ වුවද එම බදු කාලය අවසන් වීමෙන් පසුවද 2021 දෙසැම්බර් 31 දින දක්වා එම පරිශ්‍රයේ රැඳී සිට තිබුණු අතර නැවත විධිමත් පරිදි ගිවිසුමකට එළැඹීමට කටයුතු කර නොතිබුණි. ජාතික චිත්‍රපට සංස්ථාවේ සාමාන්‍යාධිකාරී විසින් 2022.05.25 දිනැතිව සැලසිනේ රූපවාහිනී ආයතනයේ සභාපති වෙත යොමුකරන ලද අංක NFC/103/04/01 දරණ ලිපිය ප්‍රකාරව රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාසික ගොඩනැගිලි කුලී තක්සේරු වාර්තා වලට අනුව 2021 දෙසැම්බර් 31 දිනට ගොඩනැගිලි කුලී රු.10,455,000 ක් ගෙවිය යුතු බවට දන්වා තිබුනද, ආයතනය මෙම ගැටළුව විසඳාගැනීමට විධිමත් ලෙස කටයුතු කර නොතිබුණි. | දින ගිවිසුම් ගත වූ එම බදු ගිවිසුමට යටත් වූ ගොඩනැගිල්ලේ සියලුම ඉදිකිරීම්, නඩත්තු කටයුතු ද 2013 වර්ෂයේ සිට 2014 ජනවාරි දක්වා සැලසිනෙ ආයතනය සිය වියදමින් සිදු කර ඇති බව ද ඔබ වෙත දැනුම් දෙමි. 2019 ජනවාරි මස 14 වන දින දක්වා ගිවිසුම්ගත වූ ගොඩනැගිලි කුලී අගය වන රු. 315,000/- ක අගයක් මාසිකව ගොඩනැගිලි කුලී ලෙස ගිණුම්වල සටහන් තබා ඇත. එලෙසම 2020-12-31 දින දක්වා ජාතික චිත්‍රපට සංස්ථාව වෙත එම මුදල් පියවා ඇත. එම මුදල් ඔවුන් විසින් ලබා ගෙන ද ඇත. 2021 වර්ෂයට අදාලව එසේ අප විසින් ගෙවිය යුතු ගොඩනැගිලි කුලී අගය, ගෙවිය යුතු විදුලිය හා ජලය ද ඇතුලුව රු. 4,115,798/47.<br>එසේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද තක්සේරු වාර්තාව මත පදනම්ව ආයතනය ගිවිසුම්ගත වී තිබුණා නම්, එලෙස රු.6,349,000 ක මුදල ගිණුම් සටහන් වලට ගෙන ගෙවීම් හා අදාල වෙන් කිරීම් කල යුතුව තිබූ බව මාගේ මතයයි.<br>ඔවුන් 2020-12-31 දින දක්වා සැලසිනෙ ආයතනයෙන් ගොඩනැගිලි කුලී ලෙස මාසිකව රු.315,000 ක මුදල ලබා ගෙන තිබූ අතර, ජල විදුලි බිල්පත් ද නිරවුල් කොට ද තිබුණි. | ගැටළු ඇති නොවීමට හා ගැටළු නීත්‍යානුකූලව විසඳාගැනීමට කටයුතු කල යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය - මුදල් රෙගුලාසි 371(2) (ආ) සහ 2020 අගෝස්තු 28 | (i) යම් විශේෂිත කාර්යයන් සඳහා ලබාදෙන තත්කාර්ය අතුරු අග්‍රිමය එක් අවස්ථාවකදී රු.100,000 නොඉක්මවිය යුතු වුවත් එම සීමාව ඉක්මවීම වැළැක්වීම සඳහා එක් නිශ්චිත කාර්යයක විවිධ කොටස් සඳහා වෙන වෙනම | අප ආයතනයේ ස්වභාවය මත රූපවාහිනී නිශ්පාදන කාර්යන්වල නිරන්තරයෙන් නියුක්ත වීමට සිදුවන බැවින්, මුදල් රෙගුලාසි 371(2) (ආ) සහ 2020 අගෝස්තු 28 දිනැති අංක PED 01/2020 | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාර කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| දිනැති අංක PED 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | අත්තිකාරම් ලබා දී තිබුණු අතර අවස්ථා 16කදී රු.2,432,000 ක් එලෙස උපරිම සීමාව ඉක්මවා අත්තිකාරම් ලබාදී තිබුණි. | දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය ප්‍රකාරව ලබා දෙනු ලබන රු. 100,000 අතුරු අග්‍රිමය එක් නිශ්පාදන කාර්යකට එකවරකට ප්‍රමාණවත් නොවේ. එය එසේ වුවද 2023 වර්ෂයේ සිට අදාල චක්‍රලේඛය ප්‍රකාරව රු.100,000 අතුරු අග්‍රිමයක් ලබා දී ඇති අතර, මෙම මුදල් රෙගුලාසිය අනුගමනය කිරීමට හැකි උපරිම උත්සාහයක් දරමින් නිශ්පාදන කාර්යන් ඉටු කිරීමට කටයුතු කර ඇත. | |
| | (ii) මාණ්ඩලික තත්වයේ නිලධාරීන්ට පමණක් තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදියයුතු වුවත් අත්තිකාරම් ලබාගත් නිලධාරියාගේ සම්පූර්ණ නම, අත්තිකාරම් ලේඛණයේ සඳහන් නොකිරීම නිසා මාණ්ඩලික නිලධාරියෙක්ද යන්න විගණනයේදී හඳුනාගත නොහැකි වූ අතර කලින් ලබාගත් අත්තිකාරම් මුදල පියවීමට පෙර එකම නිලධාරියාට නැවත අත්තිකාරම් නිකුත් කල අවස්ථා නිරීක්ෂණය විය. | 2023 වර්ෂයේ සිට අග්‍රිමයන් ලබාදීම් සම්බන්ධව නිලධාරියාගේ සම්පූර්ණ නම, අත්තිකාරම් ලේඛනයේ සඳහන් කිරීමට කටයුතු යොදා ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාර කටයුතු කල යුතුය. |
| (ආ) 2021 දෙසැම්බර් 15 දිනැති අංක 03/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ | පෙර වර්ෂයට සාපේක්ෂව අලාභය අඩු කරවාගෙන ඇති රාජ්‍ය ආයතන වල සේවකයින් සඳහා ගෙවියහැකි ප්‍රසාද දීමනාව රු.5000ක් වුවද 2021 අප්‍රේල් මාසයේදී එකතුව රු. 812,000ක් චක්‍රලේඛ විධිවිධාන වලට පටහැනි අයුරින් සේවකයින් 63 දෙනෙකු සඳහා ගෙවා තිබුණි. | මේ සඳහා අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතියක් ලබා ගෙන ඇති බව අනාවරණය නොවීය. 2022 වර්ෂයේ සිට කිසිදු ප්‍රසාද දීමනාවක් ගෙවා නොමැති බවත්, 2021-12-15 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 03/2021 ප්‍රකාරව | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාර කටයුතු කල යුතුය. |

| | | ඉදිරියේ දී කටයුතු කරන බවත් දන්වා සිටිමි. |
|---|---|---|

**1.8** **බදු රෙගුලාසිවලට අනුකූල නොවීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 2(1)(අ) වගන්තිය ප්‍රකාරව යම් තක්සේරු වර්ෂයක් සඳහා බදු අයකළහැකි ආදායමක් ලබන තැනැත්තෙකු විසින් එක් එක් තක්සේරු වර්ෂය සඳහා ආදායම් බද්ද ගෙවනු ලැබියයුතු වුවත් 1982 පෙබරවාරි 01 දින ආරම්භ කර තිබූ සැලසිනේ රූපවාහිනී ආයතනය විසින් පනතේ විධිවිධාන ප්‍රකාරව ආදායම් බදු ගෙවීමට කටයුතු කර නොතිබුණි. | ආයතනය දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇත්තේ හවුල් ව්‍යාපාරයක් ලෙසය. ආදායම් බදු ගෙවන්නේ කුමන බදු වර්ගීකරණය යටතේ ද යන්න ගැටළුවක්ව පැවැති නිසා ආදායම් බදු ගෙවා නොමැත. සැලසිනෙ රූපවාහිනී ආයතනය මෙම වසරේ රජයට අයත් සමාගමක් වූ වහාම සමාගම් බදු වර්ගීකරණය යටතේ ආදායම් බදු ගෙවීමට කටයුතු කරමි. | පනතේ විධිවිධාන ප්‍රකාර කටයුතු කල යුතුය. |
| (ආ) 2006 අංක 13 දරණ ආර්ථික සේවා ගාස්තු පනතේ 3(1) වගන්තියට අනුව යම් පුද්ගලයෙකු විසින් ගෙවන ලද ආර්ථික සේවා ගාස්තු එම පුද්ගලයා විසින් අදාළ තක්සේරු වර්ෂයේ අදාල කාර්තුව සඳහා ගෙවිය යුතු ආදායම් බද්දෙන් හිලව් කල හැකි වේ.එසේ වුවද ආයතනය ආරම්භ කරන ලද 1982 වර්ෂයේ සිටම ආදායම් බදු ගෙවා නොතිබුනු පසුබිමක වර්ෂ 10 කට ආසන්න කාලයක සිට රු. 3,599,744 ක ශේෂයක් ලැබිය යුතු ආර්ථික සේවා ගාස්තු ලෙස මූල්‍ය තත්ව ප්‍රකාශනයෙහි ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි. | ගෙවා ඇති ආර්ථික සේවා ගාස්තුව ආදායම් බද්දෙන් හිලවු කල හැකි බැවින්, එය ජංගම වත්කම් යටතේ දක්වා ඇත. | පනතේ විධිවිධාන ප්‍රකාර කටයුතු කල යුතු අතර ජංගම වත්කම් නිවැරදිව දැක්වීමට කටයුතු කල යුතුය. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 6,841,002 ක පාඩුවක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ පාඩුව රු. 29,339,593 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.22,498,591 ක වර්ධනයක්

නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ආදායම රු.229,314,272 කින් හෙවත් සියයට 98 කින් ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේදී ආදායම රු.229,314,272 කින් හෙවත් සියයට 98 කින් ඉහළ ගොස් ඇති අතර උපලේඛණ ආදායම රු.101,790,630 කින්ද, නිෂ්පාදන ආදායම රු.77,715,097 කින් ද ග්‍රැෆික් හා මුද්‍රණ ආදායම රු.58,683,407 කින්ද ඉහළ යාම ඊට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.
ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආයතන හා පරිපාලන වියදම් සියයට 53 කින් ඉහල ගොස් තිබුණි. පෙර වර්ෂයේ නොවූ ගොඩනැඟිලි වියදම්, වාහන කුලී, ගොඩනැඟිලි කුලී, සේවක සුබසාධන වියදම්, දුරකථන දීමනා, ප්‍රසාද දීමනා ආදී වියදම් රු.22,892,452ක් සමාලෝචිත වර්ෂය තුල දී දැරීමට සිදු වී තිබීම මෙන්ම පෙර වසරට සාපේක්ෂව අතිකාල වියදම්, කාර්යාල නඩත්තු වියදම්,මුද්‍රණ වියදම්, සභාපතිට ගෙවන දීමනා ආදිය ඉහළ යාමත් මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. විකුණුම් හා බෙදාහැරීමේ වියදම් පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 50 කින් ඉහල ගොස් තිබුණු අතර, මූල්‍ය වියදම් සියයට 100 කින්ද, වෙනත් වියදම් සියයට 850කින් ද ඉහළ ගොස් තිබුණි. පෙර වසරේ නොපැවති සමාජ වගකීම් ඉටුකිරීමේ ව්‍යාපෘති සඳහා වූ වියදම් රු.5,818,520 ක් මෙම වසරේ දරා තිබීමද, නෛතික ගාස්තු පෙර වර්ෂයට සාපේක්ෂව රු.925,403 ක් හෙවත් සියයට 411 කින් ඉහළ යාමද හේතුවෙන් මෙලෙස වෙනත් වියදම් ඉහළ ගොස් තිබුණි.

## 2.3 අනුපාත විශ්ලේෂණය

පෙර වර්ෂයේ දී 1.45ක් වූ ජංගම අනුපාතය සහ ක්ෂණික අනුපාතය සමාලෝචිත වර්ෂයේ දී 1.28 ක් දක්වා අඩු වී ඇති අතර ජංගම වත්කම් ඉහළ ගොස් ඇති ප්‍රමාණය ඉක්මවා ජංගම වගකීම් ඉහළ යාම ඊට හේතු වී ඇත.
පෙර වර්ෂයේ සියයට 19ක් වූ දළ ලාභ අනුපාතය සමාලෝචිත වර්ෂයේ දී සියයට 26.5 ක් දක්වා සියයට 7.5කින් ඉහළ ගොස් ඇති අතර පෙර වසරේ සියයට සෘණ 12.5ක් වූ ශුද්ධ ලාභ අනුපාතය සමාලෝචිත වසරේදී සෘණ 1.5 දක්වා වැඩි වී තිබුණි. එමෙන්ම කාරක ප්‍රාග්ධන තත්වය ඉකුත් වර්ෂයේ රු.106,755,154 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ දී එය රු.92,181,282 ක් දක්වා පහත වැටී තිබුණි.
ණය ස්කන්ධ අනුපාතය ඉකුත් වසරේදී 0.17 ක් වූ අතර සමාලෝචිත වසරේදී 0.19 දක්වා ඉහළ ගොස් ඇති අතර අඛණ්ඩව ලබන අලාභ හේතුවෙන් රඳවාගත් ඉපයුම් පහළ යාම ඊට හේතු වී ඇත.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 වර්ෂයේ ආයතනයේ සිදු වී ඇති රු.11,988,000ක් වූ සේවක මුදල් වංචාව එය සිදු වී වසර 9 කට ආසන්න කාලයක් ගත වී තිබුණද ඒ පිළිබඳ කිසිදු නඩු කටයුත්තක් සමාලෝචිත වර්ෂයේ අවසානය වන තෙක් ක්‍රියාත්මක කර නොතිබුණි.මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශයේ විමර්ශන වාර්තාවක් පමණක් පවතින අවිනිශ්චිත | 2014 වසරේ ආයතනයේ සිදු වූ රු11,988,000 ක සේවක මුදල් වංචාව වෙනුවෙන් නීතිපති විසින් මේ දක්වා නඩු පවරා නොතිබුණු අතර, 2023 වර්ෂයේ නඩු කටයුත්තකට එළඹෙන බව අප ආයතනය වෙනුවෙන් කටයුතු කරන නීතිඥතුමා විසින් දන්වා ඇති අතර, එම නඩු කටයුත්ත වෙනුවෙන් සැලසිනෙ ආයතනය වෙනුවෙන් | වත්කම් නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| තත්වයක් යටතේ එම ශේෂය සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ වෙළඳ හා ලැබිය යුතු දෑ තුළ දක්වා තිබුණි. | නීතිඥවරයෙකු ඉදිරිපත් කිරීමට මේ වනවිට මූලික කටයුතු යොදා ඇත. | |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2010 අගෝස්තු 12 දිනැති අංක 10/1682/407/014 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව රාජ්‍ය ආයතන වල දැන්වීම් හා ප්‍රචාරණ කටයුතු සැලසිනේ රූපවාහිනී ආයතනය මඟින් ඉටුකරවා ගැනීමේ බලය ලැබී වසර 10ක් ගතව තිබුණද ඒ සඳහා අවශ්‍ය මානව හා භෞතික සම්පත් අවශ්‍යතා සපුරාගැනීමට කළමනාකරණය විසින් ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණි. | 2010 අගෝස්තු 12 දිනැති අංක 10/1682/407/014 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව කටයුතු කිරීම සඳහා අවශ්‍ය මානව සම්පත් හා භෞතික සම්පත් සපුරා ගැනීමට මේ වනතුරු ද අපොහොසත් වී ඇත්තේ ආයතනයේ ආරම්භක කාල සීමාව තුල හා මෑත කාලීනව දිගින් දිගටම අලාභ ලැබීමත් හේතුවෙනි. ඒ කෙසේ වුවද මානව සම්පත් හා භෞතික සම්පත් සපුරා ගැනීමට කටයුතු කරමි. | මානව හා භෞතික සම්පත් අවශ්‍යතා සපුරා ගැනීමට කළමනාකරණය විසින් ප්‍රමාණවත් අවධානය යොමු කල යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොවිඩ් 19 තෙවන රැල්ල මැඩලීම උදෙසා මහජනතාව දැනුවත් කිරීම සහ මේ සඳහා සෘජුව දායකත්වයක් දක්වන පිරිස් දිරිගැන්වීම යන අරමුණින් "රටවැසි යුතු කම" සමාජ සත්කාර වැඩසටහනට අදාලව රූපවාහිනී ප්‍රචාරණ පටයක් නිර්මාණය කිරීම සහ ලාංඡන සහ පලඳනා මුද්‍රණය කිරිම වෙනුවෙන් එකතුව රු.10,668,520 ක් වැයකර තිබුණු අතර අදාළ ලාංඡන සහ පලඳනා 2043 ක් බෙදා නොහැර වාර්තාවේ දිනය දක්වා ආයතනය තුල ඉතිරිව තිබුණි.මෙම ආයතනය සමාලෝචිත වර්ෂයේ රු.6,841,002 ක අලාභයක් ලබා ඇති වාතාවරණය තුල නිසි සැලැස්මක් නොමැතිව සමාජ සත්කාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කළමනාකාරීත්වය ගත් තීරණය | 2021 වර්ෂයේ රටතුළ පැවති කොවිඩ් වසංගතය හේතුකොට ගෙන ආයතනය තුළ සිදු වී ඇති රාජකාරි විශාල ප්‍රමාණයක් අත්හිටු වීමට සිදු වී තිබුණි. ආයතනයේ පාලනාධිකාරිය විසින් 'රටවැසි යුතුකම' සමාජ සත්කාරක වැඩසටහන කොවිඩ් 19 වැළැක්වීමට සෘජුව ක්‍රියාකරන පිරිස් දිරිගැන්වීම වෙනුවෙන් සිදුකරනු ලැබීය. මේ සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේද අනුමැතිය හිමි විය. මෙහිදී මෙම සත්කාරය සඳහා වැයවන මුදල් සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් සිදුකරන වෙළඳ ප්‍රචාරණ වැඩසටහන් මාලාවක නිෂ්පාදන පිරිවැයෙන් ලැබෙන ලාභය මත පියවා ගැනීමට තීරණය වී තිබූ නමුත් එම නිෂ්පාදන කටයුතු සිදු නොවීම නිසා උක්ත සමාජ සත්කාරයේ වැය වූ මුදල් පියවා ගත නොහැකි වී ඇත. තවද මෙම සත්කාරක වැඩසටහන සිදුකිරීම සඳහා එවකට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය | සමාජ සත්කාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී නිසි සැලැස්මකට අනුව උපරිම අරපිරිමැසිමෙන් වියදම් අවම වන අයුරින් කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| තුළින් ආයතනයට රු.3,827,518 ක ලාභයක් ලැබීමට තිබූ හැකියාව අහිමි කර තිබුණි. | හිමිව තිබේ. ඉදිරියේදී මෙවැනි සමාජ සත්කාර සිදු කිරීමේදී ආයතනයට කිසිදු පාඩුවක් සිදුනොවන අයුරින් සිදුකිරීමට වගබලා ගැනීමට වත්මන් පාලනාධිකාරිය ක්‍රියාකරනු ලබයි. | |

## 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවශ්‍යතාවයට වඩාත් යෝග්‍ය වන ගොඩනැඟිල්ලක් විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් තුළින් තෝරාගැනීම වෙනුවට ආයතනය සමාලෝචිත වර්ෂයේදී විශාල අලුත්වැඩියාවන් සිදු කිරීමට පවතින වර්ග අඩි 6850ක ගොඩනැඟිල්ලක් මසකට රු.675,000ක මුදලකට වසර 10ක බදු පදනම මත ලබාගෙන තිබුණි. ගොඩනැඟිල්ලේ හිමිකරු හා ආයතනය අතර ඇතිකරගත් ගිවිසුම ප්‍රකාරව නිමකරන ලද වැඩ පරීක්ෂා කිරීමක් සිදුවූ බවට හෝ තවදුරටත් අලුත්වැඩියා කටයුතු අවශ්‍ය වන්නේද යන්න හඳුනාගැනීමකින් තොරව ගොඩනැඟිල්ලේ අලුත්වැඩියා කටයුතු සඳහා රුපියල් මිලියන 21ක් ද ඊට අතිරේකව රු.මි.8ක් ඉක්මවූ මුදලක් ද වැයකර තිබුණු අතර නැවත අයකරගත හැකි තැන්පතුවක් ලෙස මාස හයක ගොඩනැඟිලි කුලී වටිනාකම රු.4,050,000 ක්ද ගොඩනැඟිලි හිමිකරුට ගෙවා තිබුණි. ඒ සඳහා අවශ්‍ය මුදල් සපයාගැනීම සඳහා ආයතනයේ රු.23,000,000ක ස්ථාවර තැන්පතු තුනක් ඉවත්කරගෙන තිබුණු අතර ඒ හේතුවෙන් ආයතනයට රු. 1,066,424කට ආසන්න පොලී ආදායමක් අහිමි වී තිබුණි | මෙම අලුත්වැඩියා කටයුත්තට අදාළව රු.මි. 21 ක් ගොඩනැගිලි අලුත්වැඩියා කටයුතු වෙනුවෙන් වැයකර ඇති අතර එම අලුත්වැඩියා කටයුතුවලට අමතරව රු. 8,750,141 ක මුදලක් වැයකර තවත් අඩුපාඩු සකස් කර ඇත. එම මොහොතේ තිබූ අවශ්‍යතාවයන් මත විටින් විට අලුත්වැඩියා කටයුතු ආයතනික මුදල් භාවිතා කර සිදුකර තිබේ. මෙම කරුණ පිළිබඳ ජනමාධ්‍ය අමාත්‍යාංශය මගින් පරීක්ෂණයක් පවත්වනු ලබන අතර මින් ඉදිරියට මෙවැනි හදිසි කාර්යයන් සිදුකිරීමෙන් වැළකීමට පාලනාධිකාරිය තීරණය කොට ඇත. නව ගොඩනැගිල්ල මිලදී ගැනීමේදී ආයතනයේ පාලනාධිකාරිය සහ ගොඩනැගිලි හිමිකරු සමඟ ඇති කරගත් එකඟතාවයන් මත මාස හයක ගොඩනැගිලි කුලී නැවත අයකර ගැනීමේ පදනම මත රු. 4,050,000 ක් ගෙවා ඇත. | ආයතනයට අලාභ සිදු නොවන අන්දමින් කටයුතු කල යුතුය. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය අවසානයට කාර්ය මණ්ඩලයේ තනතුරු පුරප්පාඩු 39 ක් පැවති අතර අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත්ව නොතිබුණු තනතුරු 34 ක් සඳහා ස්ථිර සේවකයින් 06ක්, කොන්ත්‍රාත් සේවකයින් 26 ක් සහ අනියම් පදනම මත සේවකයින් 01 ක් සහ පුහුණු සේවකයින් 01 ක් වශයෙන් බඳවා ගෙන තිබුණි. | 2023 වර්ෂයේ දී කාර්ය මණ්ඩලය සැකසීමේ කටයුත්තෙහි අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මේ වන විට ලැබී ඇති අතර, එහිදී ස්ථිර කාර්ය මණ්ඩලය හා කොන්ත්‍රාත් සේවක මණඩලය නියමිත ආකාරයේ සේවය යෙදවීමට කලමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර එහි අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමි මින් ඉදිරියට නියමිත කාර්ය මණ්ඩලය අනුමත කාර්ය මණ්ඩලයට අනුව සේවකයින් සේවයෙහි යෙදවීමට ද කටයුතු කරනු ලැබේ. | අනුමත තනතුරු වල පුරප්පාඩු පිරවීමට කටයුතු කල යුතුය. |
| (ආ)ආයතනය විසින් සේවාදායකයන් සහ බාහිර පාර්ශවයන් සමඟ ගිවිසුම් ඇති කර ගැනීමේ දී, අවශ්‍ය නීතිමය ලියවිලි සකස් කර ගැනීම,නීති උපදෙස් ලබා ගැනීම සහ සේවක පරිපාලනයට අදාල කටයුතු වෙනුවෙන් බාහිර නීතිඥවරුන්ගේ සේවා සපයාගෙන තිබුණු අතර ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දී රු.1,150,403 ක් වැයකර තිබුණි.මෙම ආයතනය ආරම්භයේ සිටම අනුමත කාර්යමණ්ඩලය තුල නීති නිලධාරි තනතුරක් නොතිබුණු අතර සේවාදායකයින් සමඟ ගිවිසුම් වලට එළැඹීමට, ණය අයකර ගැනීමේ ක්‍රියාවලිය සඳහා අවශ්‍ය නීතිමය කටයුතු ඉටු කර ගැනීම ආදිය නොහැකිවීම හේතුවෙන් ආයතනයේ මෙහෙයුම් ක්‍රියාවලිය කාර්යක්ෂමව සිදු නොවීමටත් මූල්‍ය තත්වය අයහපත් වීමටත් නීතිමය අවදානම් ඉහල මට්ටමක පැවතීමටත් හේතු වී තිබුණි | ආයතනික අනුමත කාර්ය මණ්ඩලය තුල නීති නිලධාරි තනතුරක් නොමැති අතර නීති කටයුතු සඳහා නිලදාරියෙකු බඳවා ගැනීම සිදු කල ද, අධිකරණ කටයුතු සඳහා එම නිලධාරින් නොසිටින අතර එහිදී නැවත වරක් බාහිර නීතිඥවරයෙකු ගේ සේවය ලබා ගැනීමට සිදු වේ. නමුත් බාහිර නීතිඥවරයෙකු ගේ සේවය ලබා ගැනීමේ දී ඔහුට පමණක් ගෙවීමට කටයුතු සිදු කිරීම කල හැක. මේ සම්බන්ධයෙන් 2023 වර්ෂයේ දී ජනමාධ්‍ය අමාත්‍යාංශය නීති උපදේශකගේ සහය ලබා ගැනීමේ කටයුතු සිදු කිරීමට සැලසුම් කර ඇති අතර නැවත මෙම ගැටලු ඇති නොවීමට අවශ්‍ය උපදෙස් නිලධාරීන් වෙත ලබා දී ඇත. මින් ඉදිරියට මෙවැනි දුර්වලතා ඇති නොවීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | ආයතනයට ගැලපෙන පරිදි සහ අවදානම් අවම වන පරිදි නීති සේවා ලබා ගැනීමට කටයුතු කල යුතුය. |